**ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 මැයි 16 දින අධිකාරයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අධිකාරය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 23.05 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 21.86 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අධිකාරය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.19 ක් හෙවත් සියයට 5.16 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 22.20 | 21.19 | 1.01 | 4.55 |
| මූලධන | 0.85 | 0.67 | 0.18 | 21.18 |
| **එකතුව** | **23.05** | **21.86** | **1.19** | **5.16** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අධිකාරයට අදාළ විෂය අංක 00901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 1.00 | 0.97 | 0.30 | 0.86 | 2.50 | 1.47 |

**2.3 විගණන නිරීක්ෂණය**

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අධිකාරය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණු අතර 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.2.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.2.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 3.3 කාර්යසාධනය

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

2002 අංක 4 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ 7 වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ලැබෙන අභියාචනයක් මාස දෙකක කාලයක් තුළ සුදුස්සක් කර අවසන් කළ යුතුව තිබුණි. නමුත් අභියාචනා විභාග කිරීමට අදාළ වාර්තා හා නිලධාරීන් කැඳවීමේදී නියමිත පරිදි කඩිනමින් එම වාර්තා හා නිලධාරීන් ඉදිරිපත් නොවන අවස්ථා තිබුණු බවත්, විභාග කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් ගනු ලබන තීරණ පිළිබඳව අදාළ කොමිෂන් සභා දැනුවත් කරන නමුත් එම තීරණ ක්‍රියාත්මක නොවන අවස්ථා තිබුණු බවත් අනාවරණය විය. ඒ නිසා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා වූ කාල පරාසය තුළ ලැබී තිබුණු අභියාචනා 500 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් සුදුස්සක් කර අවසන් කර නොතිබුණි. එසේම 2016 වරෂයේ ලැබී තිබුණු අභියාචනා 243 කින් 10 ක් පමණක් සුදුස්සක් කර අවසන් කර තිබුණු අතර, අභියාචනා 233 ක කටයුතු සුදුස්සක් කර අවසන් කිරිමට නොහැකි වී තිබුණි.

## 3.4 අනාර්ථික ගනුදෙනු

2015 ජුනි 01 දින සිට වර්ෂ 03 ක දීර්ඝ කාල පරිච්ඡේයක් සඳහා මාසයකට රු.600,000 ක කුලියකට අධිකාරයේ කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබුණි. මේ සඳහා රජයේ තක්සේරු කුලිය 2015 මැයි 05 දින වන විටත් ලැබී නොතිබුණි. මේ නිසා අධිකාරයේ කටයුතු ඉටු කිරීම හදිසි අවස්ථාවක් ලෙස සලකා රජයේ තක්සේරුකරුගේ තක්සේරු කුලිය පදනම් කර ගැනිමට හැකිවන පරිදි ගොඩනැගිල්ල කුලියට ගැනිමට 2015 මැයි 06 දිනැති ලිපියෙන් ජනාධිපති ලේකම්වරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් අධිකාරය විසින් එම සංශෝධනයන් කුලී ගිවිසුමේ ඇතුළත් කළ නොහැකි වන පරිදි ගිවිසුමට එළම තිබුණි. 2016 ජනවාරි 21 දින රජයේ තක්සේරුකරු විසින් එහි මාසික කුලිය රු.350,000 ක් ලෙස දන්වා එවා තිබුණි. ජනාධිපති ලේකම්වරයාගේ ලිපියේ සඳහන් කොන්දේසිවලට අනුව කටයුතු නොකිරිම නිසා මාසයකට රු.250,000 ක් බැගින් වර්ෂ 3 කට රු.3,000,000 ක අනාර්ථික කුලියක් ගෙවීමට සිදු වී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| (ii) | ද්විතියික මට්ටම | 22 | 11 | 11 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 08 | 06 | 02 |
| | **එකතුව** | **32** | **19** | **13** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේදී පුරප්පාඩු 13 ක් විධිමත් පරිදි පිරවිමට කටයුතු නොකර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 04 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් සඳහා වර්ෂ 3කට වඩා වැඩි කාලයක සිට කොන්ත්‍රාත් පදනම මතද, ප්‍රාථමික මට්ටමේ තනතුරක් සඳහා අනියම් පදනම මතද, වශයෙන් නිලධාරීන් 09 දෙනෙකු බඳවාගෙන තිබුණි.